# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

**දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව සිට ගොඩගම දක්වා වන කොටසේ නඩත්තු කටයුතු සිදු කිරීම වෙනුවෙන් කම්කරු සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම.**

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ග කොටසේ පහත දැක්වෙන ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | එක් දිනකට කම්කරු ප්‍රමාණය | කොන්ත්‍රාත් කාලය (මාස) | මුළු කම්කරු දින ප්‍රමාණය | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|---|---|
| RDA/EOM&M/ SE/SP/MNT/ 2023/27 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව සිට ගොඩගම දක්වා වන කොටසේ නඩත්තු කටයුතු සඳහා කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම. | 45 | 12 | 13,500 | 425,000.00 |

02. මාර්ග සංවර්ධන අධිකාරියේ අ.මා.මෙ.න හා ක ඒකකය ක්‍රියාත්මක නියෝජිතායතනය වේ.
03. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.
04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා, ලංසුකරුවන්, මේ හා සමාන ධාරිතාවයකින් යුත් කම්කරු සැපයුම පිළිබඳ පළපුරුද්ද තිබීම සුදුසුකමක් සේ සැලකේ.
05. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් **(2023.11.15)** දක්වා ලංසුව වලංගු විය යුතුය.
06. ලංසු, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (**2023.12.13** දින දක්වා වලංගු විය යුතුය.) වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
07. ලංසුකරු විසින් ලංසු ලියකියවිලි වලට අයත් සෑම පිටුවකම අත්සන් යොදා කාර්යාලීය මුද්‍රාව තැබිය යුතුය.
08. පූර්ව ලංසු රැස්වීම **2023.08.08** වන දින ප.ව. **13.45** පැයට ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 04 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහිදී පැවැත්වේ.
09. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, එක් ලංසුවක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. **8,500.00 +** අදාළ වන බදු සමග ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් කහටගහහේන, වැල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් "අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන ඒකකයේ අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2023.07.26** දින සිට **2023.08.15** දින දක්වා පෙ.ව. **9.00** පැය සිට ප.ව. **14.00** පැය කාලය තුළ ලබාගත හැකිය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ඒජන්ත/නියෝජිතවරයා සහ ටෙන්ඩරයේ සාර්ථක ජයග්‍රාහකයින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි විය යුතුය. **2023.08.16** වන දින ප.ව. **2.00** ට ලංසු භාර ගැනීම අවසන් වේ.
10. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව **2023.08.16** වන දින ප.ව. **2.00** ට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, 01 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ලංසුපත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව සිට ගොඩගම දක්වා වන කොටසේ නඩත්තු කටයුතු සඳහා කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
11. මාර්ග සංවර්ධන අධිකාරිය, 01 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,බත්තරමුල්ල දරන ස්ථානයේ පිහිටි අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ දී ලංසු භාරගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.
12. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක :

    - ඉංජිනේරු (නඩත්තු - අ.මා.මෙ.න. හා ක ඒකකය), මාර්ග සංවර්ධන අධිකාරිය දු.ක. 038-2289201

**සභාපති,**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**01 වන මහල, මගනැගුම මහමැදුර, නො.216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**